නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 34 - 38
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# කඳුළු නෙතු අගිසි යට

එය සීතල උදෑසනක් විය. සීතලෙන් වැළකීමට මා කබායක් ඇඳ සිටි අතර මා අසලින් සිටියේ මගේ නැගණිය යි. දවස් හතරක් තිස්සේ ඇය කැස්සෙන් පීඩා වින්දත්, මම ඒ ගැන අවධානයක් යොමු නොකළෙමි. එහෙත් කැස්ස වඩාත් උග්‍ර වී ඇති බව මට වැටහිණි. කුස්සිය වෙත ගිය මම ලිපේ ගිනි දැල්වීමට උත්සාහ දැරුවෙමි. මට දැනුණේ දැඩි තනිකමකි. මම තේ කෝප්පය ද රැගෙන කාමරයට දිව ගියෙමි.

"නංගි උඹට ගොඩක් අමාරු ද ?"

"පපුව රිදෙනව ද?"

"ටිකක් රිදෙනවනේ"ඇය කීවේ නිදිමත ගතියෙනි.

"අපි අද බෙහෙත් ටිකක් ගමු නේද නංගී? නැත්තං තව වැඩි වේවි ද දන්නෑනේ? " මම කීවෙමි. ඇය තේ කෝප්පය බීව ද ඇයට තිබුණේ දුර්වල රෝගී පෙනුමකි.

"අක්කේ.... ඉස්කෝලෙ යන්නේ නැද්ද අද?"

"නෑ නංගී මම අද ඔයත් එක්ක ඔයාගෙ තනියට ගෙදර නවතිනවා."

"අක්කට ඉස්කෝලේ මහත්තයාගෙන් වේවැල් පාර කන්නයි වෙන්නේ"

"නෑ නෑ එහෙම වෙන්නේ නෑ. ඔයා බය නොවී ඉන්නකෝ"

එසේ කියූ මා හුන් අසුනෙන් නැඟිට කුස්සියට ගියේ ලුණු කැඳ ටිකක් සෑදීමේ අටියෙනි. අරපිරිමැස්ම පුරුදු වී සිටි මම දර කෝටු කිහිපයක් ළිපට දැමුවෙමි; කැකුළු සහල් ඇට කිහිපයක් බොල් වූ වළඳට දමා හොඳින් සෝදා ළිප මත තැබුවෙමි. ඇයට මෙම අවස්ථාවේ දී ලුණු කැඳ සුදුසු ආහාරයක් බව මම විශ්වාස කළෙමි. සකස් කර ගත් කැඳ, කෝප්පයට දමා ගත් මම එය ඇය වෙත ගෙන ගියෙමි.

"නංගී මම වැවට ගිහින් මල් ටික කඩලා සියාතු මාමාට දීලා එන්නම්. සියාතු මාමා මල් ටික විකුණයිනේ එතකොට. මම මැණිකේ නැන්දට ඔයා තනියෙන් ඉන්න නිසා එන්න කියන්නම්."

"මට තනි නෑ අක්කේ. මැණිකේ නැන්දටත් ගෙදර වැඩ ඇති. මම දවල් වෙලා එහෙ යන්නම්." ඇය කෙඳිරිගාමින් කීවා ය.

මම ගෙදරින් පිටත් වූයේ ඉක්මනින් නැවත ආ යුතු බව සිතමිනි. නීටාගේ ගෙදර පසු කර යන විට මැණිකේ නැන්දා හමු විය.

"නැන්දේ, නංගි ගෙදර තනියම ඉන්නේ. මම මල් ටිකක් කඩලා සියාතු මාමට දීලා විගහට එනවා."

" කෙල්ලට මක් වෙලා ද?"නැන්දා ඇසුවා ය.

"කැස්සක් හැදිලා, ඇඟත් පොඩ්ඩක් රස්නෙයි වගේ. උණ හැදෙන්න මයේ හිතේ."

"හා හා.. උඹ සුනංගු නො වී ගොහින් වරෙන්."

9 772950 655005

මා ගං ඉවුර වෙත දිව ගියේ අශ්වයෙකු විලසිනි. ගං ඉවුරට බැස ගත් මා ඕලු මල් කඩා ගත්තේ එක හුස්මට ය. දියෙන් ගොඩට පැමිණි මා සියාතු මාමාගේ මල් කඩය වෙත දිව ගියේ ද හති දමමිනි.

"මොකෝ බං මේ පණ කඩාගෙන දුවගෙන එන්නේ? උඹට කරදරයක්වත් ද?" දුර සිට ම මා එන දෙස බලා සිටි සියාතු මාමා කලබලයෙන් ඇසුවේ ය.

"නෑ නෑ මාමේ මට අද මල් විකුණන්න එන්න වෙන්නේ නෑ. චූටි අසනීප වෙලා"

" ඒ මොකෝ බං බෙහෙත් ටිකක්වත් ගත්තේ නැද්ද උඹලා?"

"දැන් ගොහින් ඒකිවත් එක්කරගෙන යන්න කියල බැලුවේ මාමේ"

"හොඳයි හොඳයි.. හවස් ජාමේ වරෙන් මේ පැත්තේ ආයෙ ම." ඔහු පැවසුවේ අනුකම්පා සහගත සිතුවිල්ලෙන් යැයි මට හැඟුණි. කියාගත නොහැකි අසරණකමක් දැනුණු නිසාවෙන් ඔහුට මඳ සිනහවක් පා මම පුද බිමෙන් ආවෙමි.

මා ආපසු ගෙදර එද්දී මැණිකේ නැන්දා නිවසට පැමිණ සිටියා ය. ඇය බොහෝ දේවල් ගැන දැනුමක් ඇති ගමේ සිටින මැදි වියේ කාන්තාවකි.

"නැන්දේ නංගිට බෙහෙත් ටිකක් ගෙනාවොත් හොඳයි නේ ද?"

"ඒක තමා මාත් කල්පනා කළේ" මැණිකේ නැන්දා පිළිතුරු දුන්නේ දෙගිඩියාවෙනි.

"පන්සලේ හාමුදුරුවන්ට කියලා මතුරපු පැන් ටිකක් ගෙනාවා මං. ඒ ටික මේකිට දෙන්න බුලත් කොළයක් අරන් වරෙන්කෝ උඹලයි වැලෙන්."

" හා නැන්දේ මං කඩාන එන්නම් "

"ඇඳේ හාන්සි වී සිටි නංගී එහි වාඩි කරවා මැණිකේ නැන්දා ඇයට පිරිත් පැන් ටික පෙව්වා ය. "මං කේතලේ ළිපේ තියලා නැන්දට තේ කහට එකක් වක් කරන්නද? "

"එපා මම දැන් කහට කෝප්පයක් බීලයි ආවේ."

හවස් වරුවේ මිතුරන් සමඟ සෙල්ලම් කිරීමට යන නංගී අද කතා බහක් නොමැති ව ම ඇඳේ හාන්සි වී සිටියි. මම වැල් පුටුව මත වාඩි වී පාර දෙස බලා සිටියෙමි.

"තව පැය දෙක තුනකින්වත් මේකිගේ උණ නොබැස්සොත් දොස්තර මහත්තයට එන්න කියන්න වෙයි ලොක්කියේ."

"අනේ නැන්දේ ඔහොම කියනකොට මට බයත් හිතෙනවා. මගේ තනියට ඉන්නෙත් මේකි විතර යි."

"බය නො වී ඉඳහන්කො. මන් දොස්තර මහත්තයට කරුණු කාරණා පහදල කියන්නම්" නැන්දා කීවා ය.

අම්මා මිය ගිය දා පටන් මා කළේ මල් විකිණීම ය. ඇතැම් දිනයන්හි වලව්වේ වැඩට ගිය විට දවසට සත දෙකක් වැටුප ලෙස ලැබිණි. දොස්තර මහතාට ගෙවීමට ප්‍රමාණවත් මුදලක් මා අත තිබුණ නමුත් මා දොස්තර මහතා පැමිණීමට පෙර සියාතු මාමා හමු විය යුත්තේ මල් විකුණා ගත් සල්ලි ලබා ගැනීමට ය. මා සියාතු මාමා හමුවී සල්ලි ඉල්ලාගෙන නැවතත් ගෙදර දිව ගියේ දොස්තර මහතා ගෙදරට පැමිණීමට පෙර එහි කටයුතු සකස් කර ගත යුතු නිසාවෙනි.

9 772950 655005

මා නංගීට බත් කවන විට දොස්තර මහතා නිවසට පැමිණියේ ය. මම ඉක්මනින් ඉඳුල් අත ගෑ අත සෝදා දොස්තර මහතාට අවශ්‍ය සබන්, වතුර ආදිය ගෙනැවිත් දුනිමි. දොස්තර මහතා රෝගය පරීක්ෂා කරන්නට විය. පසු ව කඩදාසියක් ගෙන බෙහෙත් වට්ටෝරුව ලියුවේ අනුකම්පාව පිරි දෙනෙතිනි.

“මේ බෙහෙත් ටික ලෙඩාට පුළුවන් ඉක්මනට ගෙනත් දෙන්න.”දොස්තර මහතා එලෙස පැවසුවේ මා වෙත බෙහෙත් ලියූ තුණ්ඩුව ද දික් කරමිනි.

“උඹ දන්නව ද බෙහෙත් ශාලාව තියන තැන?” මැණිකේ නැන්දා ඇසුවේ කලබලයෙනි.

“ඔව් නැන්දේ දවසක් මං අම්මට අමාරු වෙලා බෙහෙත් ගන්න ඔය බෙහෙත් ශාලාවට ගියා.”

“ළමයෝ උඹට සල්ලි තියේ ද?”

“ඔව් නැන්දේ ඇති වෙයි. මං සුටුස් ගාල ගිහින් එන්නම්.” මම කලබලෙන් පිටත් වූයෙමි.

“පරිස්සමින් ගිහින් වරෙන්. උඹලා දිහා උඹලයි අම්මා බලාගෙන ඇති.” මැණිකේ නැන්දා එලෙස කියනවා මට ඇසුණේ යාන්තමිනි. මම ධෛර්යවත් වූයෙමි. මගේ නංගිගේ ජීවිතය බේරා ගැනීමට මට කළ නොහැකි දෙයක් නැත. මහන්සිය ගැන නොසිතූ මා වේගයෙන් දිව යන අතරමග දී පාසල් මිතුරියක මුණ ගැසුණි. ඇය නිවසට යමින් සිටියේ පා පැදියෙනි.

“සමන්මලී අපේ නංගිට හොඳට ම අමාරු යි. මට බයිසිකලය දෙන්න පුළුවන් ද බෙහෙත් ශාලාවට ගිහින් එන්න” මම ඇය ඉදිරියේ යාචකයෙකු මෙන් බැගෑපත් වූයෙමි.

“පිස්සු ද බන් උඹට බයිසිකලේ දීලා මං පයින් යන්න.”සමන්මලී එසේ කියමින් යන්නට ගියා ය. මට කිසිවකුදු කියාගත නොහැකි විය.

පුතේ මතක තියා ගනින් තමන්ට තමන් විතර යි. උඹේ තාත්තට වැරදුණේ එතන. උන්දැ හැමදා ම කළේ සමාජ සේවේ. අන්තිමට උන්දැගේ සුව දුක් හොයන්න එකෙක්වත් ආවේ නෑ. ඒ අම්මා මට දවසක් කියූ කතාවකි.

“මහත්තයෝ මේ බෙහෙත් ටික මට දෙන්න පුළුවන් ද?” බෙහෙත් ශාලාවේ සිටි මහත්තයා එහි වූ ඇතැම් බෙහෙත්වලට හරි ලකුණ දැමී ය.

“මේ බෙහෙත නං ඉවර වෙලා ”

“තියෙන බෙහෙත් ටික දෙන්න මහත්තයෝ. මගේ නංගිට හොඳට ම අමාරුයි.” මා එලෙස පැවසුව ද ඔහු එය ගණනකටවත් නොගත්තේ ය.

“ආ.. මෙන්න සත නවය.”

“ගොඩක් ස්තුතියි මහත්තයා.” ඔහුට එලෙස පවසමින් ඉක්මනින් පිටත් වූයේ තවත් බෙහෙත් ශාලාවක් හොයා ගැනීමේ අරමුණෙනි. නැවතත් බෙහෙත් ශාලාවක් වෙත ගිය මම අනෙක් බෙහෙත් ටික ලබා ගත්තෙමි.

“සත අටයි ”

“ආ.. මෙන්න ගණන් කරලා ගන්න.” ඔහු එය ගණන් කරන්නට විය.

9 772950 655005

"මෙතන තියෙන්නේ සත හයයිනේ. තව සත දෙකක් මදි."ඔහුගේ හඬට මම බිය වුණෙමි.

"අනේ මහත්තයෝ මන් නොවරදවා ම හෙට ගේනවා. බෙහෙත් ටික දෙන්න මහත්තයෝ,

හ්ම්.. ආ මෙන්න." ඔහු එය මා වෙත ලබා දුන්නේ මඳ සිනාවක් ද එක් කරමිනි. මා නැවතත් ගෙදර යාමට පිටත් වූයේ මහන්සිය නොතකා ය.

"මැණිකේ නැන්දේ ආ...මෙන්න...බෙහෙත් ටික" මා කීවේ හති දමමිනි.

"දුවේ... දුවේ... ඒ මැණිකේ නැන්දා ය. මේ ටික බීලා හිටපන්කෝ. උඹලා දෙන්නට කවදාවත් වරදින්නෙ නෑ. "

මම කුස්සියට ගොස් වතුර පොල් කටුවකින් වතුර බීවෙමි. කාමරයට ගිය මම පුදුම වූයෙමි. මැණිකේ නැන්දා නංගි ව තුරුළු කරගෙන හිස පිරිමදිමින් සිටියා ය. ඇය අප සමඟ සිටීම අප දෙදෙනාට ම දෙවියන් සේ ය. අම්මා මැණිකේ නැන්දා ව ළඟින් ම ඇසුරු කළ අයෙකි. සැබැවින් ම ඇය අම්මා කෙනෙකි. මා නංගී දෙස බලා කල්පනා කරනු දුටු මැණිකේ නැන්දා මා වෙත පැමිණ හිස පිරිමදින තෙක් මට දැනුණේ නැත.

"දුවේ.."

"මේ... මේ... ඇයි නැන්දේ ? නංගි හොඳින් නේ ද? "මගේ ඇස්වල කඳුළු පිරිණි.

"ඔව් මගෙ දුවේ උඹලා දෙන්නට බුදු සරණයි. දෙවියෝ උඹලා දෙන්නා ආරක්ෂා කරයි." ඇයගේ මුවින් පිට වන්නේ සෝ සුසුම් ය. ඇය කුමක් හෝ දෙයක් සඟවන බව නිසැක ය. ඇය වෙනදා මෙන් නො ව අද ඇය දැඩි සෙනෙහසක් දක්වන්නී ය.

" උඹ කොහෙවත් නොගිහින් නංගි ළඟට ම වෙලා ඉඳිං. අර බුදු පහන ළඟ තියෙන බෝධි පූජා පොතේ තියන තුන් සූත්‍රය කියවපන් නංගිට ඇහෙන්න."

" පුතේ... අර බුදු පහන ළඟ තියෙන බෝධි පූජා පොත අරගෙන ඇවිත් ඒකේ තියෙන තුන් සූත්‍රය කියවපන්කෝ මට ඇහෙන්න." ඒ අම්මා මට අවසන් වරට ලබා දුන් නියෝගය යි. මේ සිදු වන්නේ කුමක් ද?

"අනේ නැන්දේ මට හංගන්න එපා. දොස්තර මහත්තයා මොකද් ද කිව්වේ නැන්දේ?"

"මොකුත් කිව්වේ නෑ ඉතිං, බෙහෙත් ටික දෙන්න කිව්වා. මං දැං ගෙදර ගිහින් රෑ බෝවෙන කොට ආයෙ ම එනවා. උඹ කොහෙවත් යනවා එහෙම නෙව." මැණිකෙ නැන්දා ඒ බව පවසමින් ගෙදරින් පිටත් වූයේ අම්මාගේ පින්තූරය දෙස බලා දිගු සුසුමක් ද හෙළමිනි.

මා තුන් සූත්‍රය කියමින් සිටිය දී නංගිට නින්ද ගොස් තිබිණි. මම ඇගේ හිස අතගාමින් ඇයට ආශීර්වාද කළෙමි. රාත්‍රියට ඇයට දිය යුතු බෙහෙත් සැකසීමට අවශ්‍ය උණු වතුර සැකසීමට කුස්සියට පිවිසි මම එය රත් වන තෙක් කුස්සියේ බංකුව මත වාඩි වී සිටියෙමි. හිරු බැස ගොසින් ය. අන්ධකාරය පැතිරෙමින් පවතී. මගේ සිතට දැඩි වේදනාවක් මෙන් ම තනිකමක් ද දැනෙන්නට විය. නංගී තවමත් අසනීපෙනි. මම කුස්සියට වී ඉකිගසා හඬා වැලපුණෙමි.

"ලොක්කී" ඒ මැණිකේ නැන්දාගේ හඬයි. මා කඳුළු පිස දමා ගත්තේ ඇය දකීවි යන බියෙනි.

"නංගීගේ මූණ ඩිංගක් පිහදාන්නත් එක්ක ම වතුර ටිකක් රත් කළා නැන්දේ."

"බෙහෙත් ටික ගනින්කෝ මේකට දාලා තව ටිකක් තැම්බෙන්න අරින්න." නැන්දා පැවසුවා ය.

"මෙන්න නැන්දේ බෙහෙත් ටික" මා ඇයගේ අතට එය දී නැවතත් කාමරයට ගියේ නංගීගේ මුහුණ දැකීමට ය. ඇය බෝනික්කියක මෙන් නිහඬ ව සිටියි. වෙනදාට ඇය ගිරවියක සේ කියවන්නී ය. ඇතැම් විට ඇය මගෙන් බැණුම් අසයි. ඒත් අද ඇය මා ඉදිරියේ නිහඬ ය. මම කිසිවක් නොපැවසුවෙමි. ඇය අවදි කරන්නට ලෝබ ය. ඇයගේ හිස පිරිමැදි මම අම්මාගේ හා තාත්තාගේ පින්තූර දෙක වෙත ගොස් නංගීට ඉක්මනින් සනීප වේවායි ප්‍රාර්ථනා කළෙමි.

"නැන්දේ... නංගිට හොඳට ම නින්ද ගිහින් වගේ."

"හ්ම්...කමක් නෑ තව ටිකකින් ඇහැරවලා මේ බෙහෙත් වතුරෙන් ඇඟ සෝදවමු." මැණිකේ නැන්දා පැවසුවා ය.

"රෑ බෝවී ගෙන එන්නේ. මං විගහට ගිහින් පන්සලේ බෝධීන් වහන්සේ වැඳලා එන්න ද නැන්දේ?"

"උඹේ කැමැත්තනේ. පලයන් ගොහින් ඉක්මන් කොට වරෙන්."

මා සුදු පැහැති රෙද්දේ කහ පාට මල් ඇති ගවුමකින් සැරසී සුදු රෙදි කැල්ලක් හා කහ කැල්ලක් ගෙන පන්සල වෙත දිව ගියේ බුදුන් වහන්සේ මාගේ එක ම විශ්වාසය වූ නිසා ය. පන්සලේ බෝපත් හඬ මාගේ සිතට තරමක සැනසිල්ලක් ගෙන දුණි. මම බෝ අත්තක් ගෙන පඬුරු ගැට ගැසූ පසු ආවාස ගෙට ගොස් පොඩි හිමිගෙන් පිරිත් නූලක් ගෙන මගට බැස්සෙමි. ටික දුරක් යන විට මම දුටු දසුනින් පුදුම වූයෙමි. මා දුටුවේ සිනාසෙමින් මා වෙත දිව එන සුදු ඇඳුමකින් සැරසී සිටින මගේ නංගී ය.

"අක්කේ.... අක්කේ අපි යමු " නංගී මා වෙත දිව ආවේ ය. මට දැනුණු සතුට වචන කර ගත නොහැකි ව මම කඳුළු පිරි දෑසින් තවමත් ඇය දෙස බලා හිඳියෙමි.

අප ටික දුරක් දැත් පටලන් ආ අතර, නිවසට ළඟාවත් ම මට ඇයගේ දෑත ගිලිහුණි. මා පියවි සිහියට ආවේ එවිට ය. අපේ මිදුලේ ගමේ කිහිප දෙනෙකු සිටි අතර, ඔවුන් නංගි බැලීමට පැමිණෙන්නට ඇතැයි මම උපකල්පනය කළෙමි. ඔවුන් අතුරෙන් මා මැණිකේ නැන්දා සොයා ගියේ සිතේ උතුරා යන සතුටිනි. ඒ සතුට සඳහට ම නැති වී යාමට ගත වූයේ නිමේෂයකි. මැණිකේ නැන්දාගේ උකුළේ වැතිර සිටියේ මොහොතකට පෙර මගෙ අතෙ එල්ලී ආ නංගී ය. මට කිසිවක් සිතා ගත නොහැකි විය.

"නැන්දේ........?" මගේ ඇඟ පණ නැති විය.

"නංගී අපි දාලා ගියා කෙල්ලේ. උඹ පන්සල් ගියාට පස්සේ ඒකීට අමාරු වුණා. ඒකි උඹ ව හෙව්වා." ඒ මැණිකෙ නැන්දාගේ කටහඬ ය.

මට ඇසුණේ එපමණකි. එවිට ම මා සිහිසුන් ව ඇද වැටුණි. නැවත සිහිය පැමිණෙන විට නංගී මැද සාලයේ සිනාමුසු මුහුණින් කුඩා පෙට්ටියක සැතපී සිටියා ය. මා හට දැන් කිසිවෙකු නැත. පණ මෙන් පරිස්සම් කළ නංගී ද මා හැර දමා ගොස් අවසන් ය.

අමුණුගම වලව්වේ වත්සලා ලක්මාලි කුමාරි ගුණතිලක
සිව්වන වසර
රුහුණ විශ්වවිද්‍යාලය
Wathsalaamunugama95@gmail.com

9 772950 655005